රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ:- 06/2004

මගේ අංකය: ආ/9/6/48
රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය
කොළඹ 07.
2004.12. 15 වැනි දින.

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන් සහ
දෙපාර්තමේන්තු ප්‍රධානීන්.

**<u>ආයතන සංග්‍රහයේ XLVIII වැනි පරිච්ඡේදය සංශෝධනය කිරීම</u>**

ආයතන සංග්‍රහයේ II වැනි කාණ්ඩයේ XLVIII වැනි පරිච්ඡේදයේ විධිවිධාන පහත සඳහන් පරිදි සංශෝධනය කිරීමට රජය විසින් තීරණය කර ඇත. ඒ අනුව දැනට චෝදනා පත්‍ර නිකුත් කර ඇති විනය පරීක්ෂණවලට අගතියක් නොවන ලෙස ආයතන සංග්‍රහයේ II වැනි කාණ්ඩයේ XLVIII පරිච්ඡේදය පහත සඳහන් පරිදි සංශෝධනය කෙරේ.

I. XLVIII වැනි පරිච්ඡේදයේ 19:5 වැනි උප වගන්තිය දැනට පවතින විධිවිධාන වෙනුවට පහත සඳහන් විධිවිධාන ඇතුලත් කිරීම.

19:5 රජයේ සේවයෙන් විශ්‍රාම ලත් සහ ස්වකීය සේවා කාලය තුල දී ආයතන සංග්‍රහයේ පළමුවැනි උපලේඛනය යටතේ දක්වෙන වරදකට දඬුවම් නොලැබූ, මාණ්ඩලික නිලධාරියෙකු වශයෙන් දස වසරකට හෝ ඊට වැඩි සේවා කාලයක් ඇති නිලධාරියෙකු හෝ විනය පරීක්ෂණ නිලධාරියෙකු වශයෙන් හෝ පැමිණිල්ල මෙහෙයවන හෝ රැකවරණ නිලධරයෙකු වශයෙන් හෝ වසර පහකට වැඩි කාලයක් කටයුතු කර පළපුරුද්ද ඇති හා මාණ්ඩලික ශ්‍රේණියක වසර අටක සේවා කාලයක් ඇති විශ්‍රාම ලත් නිලධරයන්ගෙන් සහ දස වසරකට වැඩි පළපුරුද්ද ඇති නීතිඥයන්ගෙන් සමන්විත විනය පරීක්ෂණ නිලධාරී සංචිතයක් රාජ්‍ය පරිපාලන විෂය භාර ලේකම්වරයා විසින් ස්ථාපනය කොට අවස්ථාවෝචිත පරිදි සංශෝධනය කරමින් අඛණ්ඩව පවත්වාගෙන යා යුත්තේය. එසේම එම පරීක්ෂණ මඩුල්ල සම්බන්ධයෙන් විස්තර වරින්වර අමාත්‍යාංශ ලේකම්වරුන්, දෙපාර්තමේන්තු ප්‍රධානීන් සහ අනෙකුත් බලධරයන්ට ලිඛිතව දැනුම් දීම රාජ්‍ය පරිපාලන විෂය භාර ලේකම්වරයාගේ වගකීම වන්නේය.

II 22:1 උප වගන්තියට පසුව පහත සඳහන් 22:1:1 උප වගන්තිය ඇතුලත් කිරීම:

22:1:1 චූදිත නිලධාරියෙකුට විරුද්ධව චෝදනා පත්‍රයක් නිකුත් කර එක් වසරක් ඇතුලත අදාල පරීක්ෂණය නිම කර විනය නියෝගයක් නිකුත් කිරීමට විනය බලධාරියා අවශ්‍ය පියවර ගතයුතුය. 31:11 උප වගන්තියෙහි සඳහන් චෝදනාවක් නොවන අවස්ථාවක චූදිත නිලධාරියාගේ ප්‍රමාදයක් නිසා පරීක්ෂණය පමා වන අවස්ථාවක දී හැර වෙනත් කරුණක් නිසා එසේ වසරකට වඩා පරීක්ෂණය අවසන් කර විනය නියෝගය නිකුත් කිරීමට ප්‍රමාද වන්නේ නම් චූදිත නිලධාරියා වැඩ තහනමට ලක් කර ඇත්නම් ඔහු නැවත සේවයේ පිහිටුවා එදින සිට වැටුප් ගෙවිය යුතුය. එතෙක් නොගෙවන ලද වැටුප පිළිබඳව විනය නියෝගය ලැබීමෙන් පසු එහි සඳහන් පරිදි කටයුතු කළයුතුය.


III **27:10** උප වගන්තියට පසුව **27:10:1** සහ **27:10:2** උප වගන්ති ඇතුලත් කිරීම:

**27:10:1** අල්ලස් හෝ දූෂණ හෝ රාජ්‍ය විරෝධී හෝ ත්‍රස්තවාදී ක්‍රියා හෝ සම්බන්ධ චෝදනා සම්බන්ධයෙන් හැර නිලධාරියාගේ රාජකාරියට අදාල නොවන සාපරාධී වරදක් සම්බන්ධයෙන් අධිකරණයේ නඩු පවරා ඇති අවස්ථාවක චෝදනාවේ ස්වභාවය අනුව නිලධාරියා නැවත සේවයේ පිහිටුවීම රාජ්‍ය සේවයේ යහපතට හානිකර නොවන්නේ යැයි විනය බලධාරියා තීරණය කරන්නේ නම් එවැනි අයකු නැවත සේවයේ පිහිටුවිය යුතුය.

**27:10:2** 27:10:1 උප වගන්තිය යටතේ නැවත සේවයේ පිහිටුවීම රාජ්‍ය සේවයේ යහපතට හානිකර බව විනය බලධාරියාට හැඟෙන්නේ නම් අධිකරණ තීන්දුව ලැබෙන තෙක් තවදුරටත් එවැනි නිලධාරියෙකුගේ වැඩ තහනම් කළයුතුය. එවැනි අයකු සම්බන්ධව අධිකරණ තීන්දුව ලැබීමට වසරකට වැඩි කාලයක් ගත වන්නේ නම් නිලධාරියාට වැටුපෙන් භාගයකට නොවැඩි මුදලක් ගෙවීමට බලය දීමට විනය බලධාරියාට හැකිය.

IV **31:12** උප වගන්තියට පසුව පහත සඳහන් **31:12:1** උප වගන්තිය ඇතුලත් කිරීම:

**31:12:1** 27:10:2 උප වගන්තියෙහි සඳහන් අවස්ථාවක අධිකරණ තීන්දුව වසරක් ඇතුලත නොලැබුණහොත් නිලධාරියාගේ මාසික වැටුපෙන් භාගයකට නොවැඩි මුදලක් ඔහුට ගෙවීමට බලය දීමට විනය බලධාරියාට හැකිය.



එස්.සී. මාන්නප්පෙරුම
ලේකම්
රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ
කටයුතු අමාත්‍යාංශය